// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2248/36 - 2021 ඔක්තෝබර් මස 06 වැනි බදාදා - 2021.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 2/1976 (iii)

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත**

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදනු ලැබ, වැවිලි අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද නියෝග.

**ජයම්පති මොල්ලිගොඩ,**
සභාපති,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

කලින් කල සංශෝධිත, 1986 ජනවාරි මස 28 වැනි දිනැති අංක 386/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1986 ශ්‍රී ලංකා තේ මණ්ඩල (තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීමේ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 4 (ආ) වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"(ආ) මේ නියෝග යටතේ කරනු ලබන එක් එක් ලියාපදිංචි කිරීමක් සම්බන්ධයෙන් පහත දැක්වෙන පරිදි ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් ගෙවිය යුතු යː-

(i) මහා පරිමාණ දේශීය තේ ඇසුරුම්කරු - රුපියල් විසිපන් දහසක් (රු. 25,000);

(ii) මධ්‍ය පරිමාණ දේශීය තේ ඇසුරුම්කරු - රුපියල් දසදහසක් (රු. 10,000);

(iii) කුඩා පරිමාණ දේශීය තේ ඇසුරුම්කරු - රුපියල් පන්දහසක් (රු. 5,000);

(iv) අපනයන තේ ඇසුරුම්කරු - රුපියල් විසිපන්දහසක් (රු. 25,000);

1A - PG 5568 — 445 (2021/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එහි 6 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"6 (1) මේ නියෝග යටතේ වන සෑම තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීමක් ම අදාළ වර්ෂයේ ජනවාරි 31 වැනි දින හෝ එදිනට පෙර වාර්ෂිකව අලුත් කරනු ලැබිය යුතු ය.

(2) එම එක් එක් ලියාපදිංචිය අලුත් කිරීමක් සඳහා පහත දැක්වෙන පරිදි අලුත් කිරීමේ ගාස්තුවක් ගෙවිය යුතු ය.

(අ) මහා පරිමාණ දේශීය තේ ඇසුරුම්කරු - රුපියල් දසදහසක් (රු. 10,000);

(ආ) මධ්‍ය පරිමාණ දේශීය තේ ඇසුරුම්කරු - රුපියල් පන්දහසක් (රු. 5,000);

(ඇ) කුඩා පරිමාණ දේශීය තේ ඇසුරුම්කරු - රුපියල් දෙදහස් පන්සියයක් (රු. 2,500);

(ඈ) අපනයන තේ ඇසුරුම්කරු - රුපියල් දසදහසක් (රු. 10,000);

(3) "ඇසුරුම්කරු යන යෙදුමේ අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථන ආදේශ කිරීමෙන් :-

" මහා පරිමාණ දේශීය තේ ඇසුරුම්කරු" යන්නෙන්, මාසික විකුණුම් ප්‍රමාණය තේ කිලෝග්‍රෑම් පන්දහසට (කි. ග්‍රෑම්. 5000) වැඩි තැනැත්තෙකු හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

" මධ්‍ය පරිමාණ දේශීය තේ ඇසුරුම්කරු" යන්නෙන්, මාසික විකුණුම් ප්‍රමාණය තේ කිලෝග්‍රෑම් දෙදහස් පන්සීයකට (කි. ග්‍රෑම්. 2500) වැඩි කිලෝග්‍රෑම් පන්දහස (කි. ග්‍රෑ. 5000) දක්වා වන තැනැත්තෙකු හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

" කුඩා පරිමාණ දේශීය තේ ඇසුරුම්කරු" යන්නෙන්, මාසික විකුණුම් ප්‍රමාණය තේ කිලෝග්‍රෑම් දෙදහස් පන්සියය (කි. ග්‍රෑ. 2500) දක්වා වන තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

" අපනයන තේ ඇසුරුම්කරු" යන්නෙන්, අපනයනය කිරීම සඳහා කාර්ටන්, කැනිස්ටර්, පැකැට්ටු, ලී පෙට්ටි, කෑන්, පිඟන් මැටිවලින් සෑදූ බරණි, බටපතුරු ඇසුරුම් වැනි යම් බහාලුම්වල හෝ සිල්ලරට විකිණීමේ වෙනත් යම් ආකාරයක ඇසුරුම්වල කිලෝග්‍රෑම් පහට (කි. ග්‍රෑ. 5) නොවැඩි පාරිභෝගික ඇසුරුම්වල හෝ ආහාරපාන සපයන ඇසුරුම්වල තේ අසුරණ තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

10 - 254

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.